[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம්

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 07 ශ්‍රේණිය | විෂයය - භූගෝල විද්‍යාව | පත්‍රය I/II | පැය 02 යි. |
|---|---|---|---|

නම ..........................................................................................................

### I පත්‍රය

**අංක 1 - 5 දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01). පෘථිවි ආදර්ශ ගෝලය දකුණු අක්ෂාංශ 23 $\frac{1}{2}$ රේඛාව,

1.කර්කටක නිවර්තනය වේ. 2.මකර නිවර්තනය වේ.
3.සමකය වේ. 4.ජාත්‍යන්තර දින රේඛාව වේ.

02). ආසියා මහද්වීපයට අයත් දූපතක් වන්නේ,

1.නවසීලන්තය. 2.බ්‍රිතාන්‍ය දූපත්.
3.ජපන් දූපත්. 4.කියුබාව.

03). පහත සඳහන් කඳු අතරින් ශේෂ කන්දක් වන්නේ,

1.සීගිරිය 2.පිදුරුතලාගල
3.නමුණුකුල 4.සමනල

04). ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයෙන් වෙන්වන පටු මුහුදු තීරය හඳුන්වන්නේ,

1.මලක්කා සමුද්‍ර සන්ධිය නමිනි 2.පෝක් සමුද්‍ර සන්ධිය නමිනි
3.ජිබ්‍රෝල්ටා සමුද්‍ර සන්ධිය නමිනි 4.ඕම්ස් සමුද්‍රසන්ධිය නමිනි.

05). ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ හඳුනා ගන්නට ලැබෙන ජාතික වනෝද්‍යානයක් වන්නේ,

1විල්පත්තුව 2.යාල
3.මාදුරුඔය 4.කවුඩුල්ල

**අංක 06 - 10 දක්වා ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

**(අත්ලාන්තික්, ඉන්දියන්, ඉතාලිය, පාකිස්ථානය, 12 200, 11 200, ආසියානු, යුරෝපා, කර්කටක, මකර)**

06). විශාලත්වය අතින් දෙවන සාගරය ලෙස…………........………සාගරය හඳුනාගත හැකිය.

07). ලොව විශාලම මහද්වීපය…………………….…...... මහද්වීපය වේ.

08). යුරෝපා මහද්වීපයට අයත් රටකි………………………

09). "රාෂ්ට්‍රීය මුහුදු සීමාව" සඳහා නාවික සැතපුම්…………………………...ක් හිමිවේ.

10). සමකයට උතුරින්………………….නිවර්තනය පිහිටා ඇත.

**අංක 11- 15 දක්වා දී ඇති ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද වරහන තුළ යොදන්න.**

11). පාකිස්තානය සමාජයීය සංවර්ධනය තුළින් ඉහළ මට්ටමකට ළඟාවී ඇත. ( )

12). මුස්ලිම් ජනතාව රාමසාන් උත්සවය සමරයි. ( )

13). ස්වාභාවික නිර්මාණයක් ලෙස වැව හඳුන්වා දිය හැකිය. ( )

14). තෙත් කලාපීය ප්‍රදේශවල උසින් වැඩි ශාක දක්නට ලැබේ. ( )

15). "සානු"වෙරළබඩ තැනිතලාවේ දක්නට ලැබෙන භූවිෂමතා ලක්ෂණයකි. ( )

**අංක 16 – 20 දක්වා ප්‍රශ්නවලට නිශ්චිත කෙටි පිළිතුර සපයන්න.**

16). ලොව කුඩාම මහද්වීපය ලෙස……………......…………හඳුනාගත හැකිය.

17). ශ්‍රී ලංකාවේ දෙවුන්දර තුඩුවේ සිට …….................………..දක්වා දිග 432km කි.

18). වෙරළ ආශ්‍රිතව හා ගංගා මෝය අවට…………..........……. ශාක දක්නට ලැබේ.

19). ශ්‍රී ලංකාව………………....……… සාගරයේ පිහිටි දූපතකි.


20). මුහුදු මට්ටමේ සිට මීටර් …………………වඩා උසින් යුක්ත බිම්වල කඳුකර භූ දර්ශන දැකිය හැකිය.

**(ලකුණු 2 ✗ 20 = 40)**

## II පත්‍රය

- **පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.**
- **අනෙකුත් ප්‍රශ්න අතරින් ප්‍රශ්න 04 පිළිතුරු සපයන්න.**
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05කි.**

01). පහත දැක්වෙන ශ්‍රී ලංකාවේ භූ විෂමතා කලාප සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




I). අංක 1 සහ අංක 2 ලෙස ලකුණු කර දක්වා ඇත්තේ ලංකාවේ උතුරු මායිම හා දකුණු මායිම සටහන් කරන තුඩු දෙකකි.ඒවා,

a. 1………………………..

b. 2………………………….. නම් කරන්න. (ලකුණු 2)

II). A, B සහ C යන අක්ෂරවලින් දැක්වෙන ප්‍රධාන භූ විෂමතා කලාප තුන නම් කරන්න.

A……………………….

B………………………..

C……………………….. (ලකුණු 3)

III). ශ්‍රී ලංකාව සංචාරක ආකර්ෂණය දිනා ගැනීමට හේතුවන භූ විෂමතා සාධක දෙකක් නම් කර කෙටියෙන් විස්තර කරන්න.

IV). ඉහත සිතියමෙහි දක්වා ඇති C කලාපයෙන් හඳුනාගත හැකි,

a.කඳු පන්ති දෙකක්

b.සානු දෙකක්

c.දිය ඇලි දෙකක් නම් කරන්න. (ලකුණු 6)

02).

I). ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය කොපමණද? (ලකුණු 2)

II). ශ්‍රී ලංකාවට වැසි ලැබෙන ප්‍රධාන වර්ෂාපතන ක්‍රම තුන නම් කරන්න. (ලකුණු 4)

III).ඉහත ඔබ නම් කළ වර්ෂාපතන ක්‍රමයක් පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 5)

03).

I). දකුණු ආසියාවට අයත් රටවල් දෙකක් නම් කරන්න. (ලකුණු 2)

II). සමාජ සංවර්ධන මට්ටම් හඳුනා ගැනීමට යොදාගනු ලබන සමාජ සංවර්ධන දත්ත ලබාගන්නා ක්ෂේත්‍ර හතරක් දක්වන්න. (ලකුණු 4)

III). රටක අධ්‍යාපන පහසුකම් වැඩි දියුණු වීම නිසා ලැබෙන වාසි පහක් දක්වන්න. (ලකුණු 5)

04)

I). ශ්‍රී ලංකාව තුළ හඳුනාගත හැකි ප්‍රධාන ආගම් හා ජාතීන් දෙක බැගින් ලියා දක්වන්න. (ලකුණු 2)

II). ශ්‍රී ලංකාව තුළ දක්නට ලැබෙන බහු ආගමිකයන් හා ජාතීන් ඔවුන්ගේ අනන්‍යතාව විදහා දක්වන අංග හතරක් ලියා දක්වන්න. (ලකුණු 4)

III). ශ්‍රී ලාංකිකයන් සතු ස්පෘශ්‍ය උරුම අතරින් මානව නිර්මාණ දෙකක් හා ස්වභාවික නිර්මාණ තුනක් බැගින් ලියා දක්වන්න. (ලකුණු 5)

05).

I). ශ්‍රී ලංකාවේ තෙත් කලාපයෙන් ගලා බස්නා ගංගා දෙකක් නම් කරන්න. (ලකුණු 2)

II). ශ්‍රී ලංකාවේ,

a- පරිපාලන අගනගරය හා

b- වාණිජ නගරය සඳහන් කරන්න. (ලකුණු 4)

III). තෙත් කලාපයේ භූ දර්ශනයට සජීවී බවක් ලැබීමට හේතුවන කරුණු දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)

06)

I). වියළි කලාපීය භූ දර්ශනයන් තුළ දක්නට ලැබෙන ජාතික වනෝද්‍යාන දෙකක් නම් කරන්න. (ලකුණු 2)

II). වියළි කලාපීය භූ දර්ශනය තුළ දක්නට ලැබෙන මානව ක්‍රියාකාරකම් දෙකක් ඉදිරිපත් කරන්න. (ලකුණු 4)

III). ශ්‍රී ලංකාවේ වියළි කලාපීය ප්‍රදේශ හඳුනාගෙන ඇත්තේ කුමන සාධක පදනම් කරගෙනදැයි කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 5)


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න